**ගල්ගමුව ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.8,927,325 ක් වූ ගල්ගමුව පැරණි බස් නැවතුම්පොල වෙළඳකුටි සහ වැසිකිළි පද්ධතිය සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, ඉඩම් සහ ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනීත කර නොතිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුය. |
| (ආ) | මාර්ග තලන රෝලේ තක්සේරු වටිනාකම රු.4,000,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් තැබීම නිවැරදිව කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ජල පිරිපහදු ඒකකයේ වටිනාකම රු.38,000 ක් වූ ජල මෝටරයක වටිනාකම සහ වර්ග 33 කට අදාළ ඉන්වෙන්ට්‍රිගත කර තිබූ භාණ්ඩ 149 ක් වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අවසන් වී නොතිබූ නඩු 07 ක් පැවති අතර මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් හෙලිදරව් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එම නඩු කටයුතු වෙනුවෙන් සභා අරමුදලින් රු.106,900 ක් වැය දරා තිබුණි. | -එම- | අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.25,128,818 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 152 වගන්තිය | වසර 05 කට වඩා පැරණි හිඟ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 570 | රු.3,443,848 ක් වටිනා තැන්පත් 514 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 ඡේදය | වාහන හා යන්ත්‍රෝපකරණ 07ක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| (i) | 33 රීතිය | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තුවක් එක් එක් කාර්තුව අවසානයෙහි දී වරිපනම් බදු ලිපිකරු විසින් පිළියෙල කර සභාපතිවරයාගේ අත්සන සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 61 රීතිය | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබා ගන්නා ලැයිස්තුවේ ඇතුළත් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. බදු නොගෙවන කර්මාන්ත පිළිබඳව ලේඛනවල ඇතුළත් නොවූ අතර | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | රීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |

(ඉ) පළාත් පාලන චක්‍රලේඛ

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2010 ජූලි 30 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු අංක 2010/02 චක්‍රලේඛයේ 1.2. වගන්තිය | විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 03/2015 හා 2015/11/02 දිනැති චක්‍රලේඛය | විදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | අංක 2018/elocal government 01 හා 2018/07/19 දිනැති චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් කටයුතු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.11,773,257 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.17,224,730 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කළ ආදායමෙන්) |
| | රු.000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 3316 | 3316 | 2643 | 673 | 4725 | 2961 | 2292 | 668 |
| කුලී | 12327 | 12327 | 11344 | 983 | 22713 | 10628 | 9629 | 998 |
| බලපත්‍ර ගාස්තු | 3359 | 3359 | 3353 | 6 | 2120 | 2141 | 2141 | - |
| වෙනත් ආදායම් | 25139 | 24944 | 13099 | 11845 | 21958 | 27153 | 19076 | 8077 |
| එකතුව | 44,141 | 43,946 | 30,439 | 13,507 | 51,516 | 42,883 | 33,138 | 9,743 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.1,052,285 ක හිඟ වරිපනම් හා බදු ශේෂයක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | හිඟ වරිපනම් ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමටත්, හිමිකරු හඳුනාගෙන නොමැති දේපලවල හිමිකරුවන් හඳුනා ගැනීමටත් , හඳුනා නොගත් වෙනස ඉදිරියේ දී නිරවුල් කර ගැනීමටත් කටයුතු කළ යුතු ය. |
| (ආ) | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05කට වරක් කළ යුතු වුව ද ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු තක්සේරුව අවසන් වරට සිදුකර තිබුණේ 2015 වර්ෂයේ දීය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාලීනව තක්සේරු කර බදු අයකරගත යුතු ය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.435,921 ක හිඟ කඩ කුලී ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | -එම- | හිඟ ශේෂ කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,070,808 ක් හා මුද්දර ගාස්තු රු.4,774,297 ක් විය. | -එම- | හිඟ ශේෂ කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් පුනරාවර්තන වැය රු.3,893,141 ක් හා ප්‍රාග්ධන වැය රු.1,435,000 ක් ලෙස එකතුව රු.5,328,141 ක් දරා තිබුණ ද කසළ අලෙවියෙන් ලද ආදායම රු.464,900 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක වටිනාකම රු.24,222,287 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සභාව වෙත අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතු වටිනාකම රු.48,982,744 ක් විය. | -එම- | ගෙවිය යුතු ශේෂ විධිමත් පරිදි කඩිනමින් නිරවුල් කළ යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට ස්ථාන මාරු වී ගිය රු.13,461 ක අයවිය යුතු ණය ශේෂයක් පැවතුණි. | -එම - | සේවක ණය නිසි පරිදි අයකර ගත යුතු ය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 21 ක් හා අතිරික්ත 21 ක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | කාර්යය මණ්ඩල අවශ්‍යතාව කාලීනව සමාලෝචනය කළ යුතු ය. |
| (ආ) | අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික දීමනා පදනම යටතේ බඳවා ගත් සේවකයින් 07 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.2,500,271 ක් ගෙවීම් කර තිබුණි. | -එම- | -එම- |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමි සංඛ්‍යාව 151ක් අතුරින් සුසාන භූමි 117ක අයිතිය සභාව සතුව නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | සභාව සතුව වීදි පහන් කණු 3645ක් ලේඛනගතව පැවති අතර වීදිපහන් කණුවේ භෞතිකව අංකනය කර තිබූ සංඛ්‍යාව 20ක් විය. | -එම- | සියලු වීදි පහන් අංකනය කළ යුතු ය. |
| (ඇ) | සභාවේ ස්ථාවර වත්කම් සමීක්ෂණය අනුව හඳුනාගෙන තිබූ ස්වර්ණ ජයන්ති පුස්තකාල ඉඩම, නාහෙට්ටිකුලම ප්‍රජාශාලා ඉඩම සහ ගොඩනැගිලි 07 ක වටිනාකම තක්සේරු කර නොතිබුණි. | නිරීක්ෂණ සමග එකගවන බව | ගිණුම් තැබීම නිවැරදි කළ යුතු ය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙහි පැවති GI බට 109 ක ඌනතාවයක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ඌනතාවයට හේතු පරීක්ෂා කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් විෂයයන් 7ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 22 ක සිට 237 ක් දක්වා විචලනයන් පැවති අතර වියදම් විෂයයන් 03ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 22 සිට 40 දක්වා විචලනයක් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | ඇස්තමේන්තු හැකිතාක් තාර්කිකව පිළියෙල කළ යුතු ය. |